වැඩ බැරි දස ගැන කතා


නිකොලායි නෝසව්



7

# ගුවන් ගමනට සූදානම් වීම

දේදුන්න (රාදුගා) ප්‍රකාශකයෝ · මොස්කව්



වැඩි බැරී දූස් ගැන කතා

නිකොලායි නෝසව්

7

# ගුවන් ගමනට සූදානම් වීම

අනුවාදය – දැදිගම වි.රුද්රිගු
චිත්‍ර – බරිස් කලෞෂින්



දේදුන්න (රාදුගා) ප්‍රකාශකයෝ
මොස්කව්





පහුව දා උදේ පාන්දර අක්සපාල එයා ගේ යාළුවන්ව අවදි කෙරෙව්වා. සියලු දෙනා ම නැගිටලා සංචාරයට සූදානම් වුනා. ඉස්කුරුප්පුවා යි, මූරිච්චිය යි ඒ ගොල්ලන් ගේ සම් කබා ඇඳ ගත්තා. අඩයම්සේන බූට්ස් සපත්තු පය ලා ගත්තා. ඒවා දණහිසට ත් වැඩිය උස යි. ඒ වගේ සපත්තු පය ලා ඇවිදීමට බොහොම හොඳ යි. කඩිනම් රාළ එයා ගේ අපූරු ඇඳුම ඇඳ ගත්තා. ඒ ගැන සුළු විස්තරයක් කරන්න ඕන. හැමදා ම ඉක්මන් වන කඩිනම් රාළ වේලාව නිකම් අපතේ යැවීමට කැමති නැහැ. ඉතින් ඒ නිසා එයා ලෑස්ති කර ගත්තා බොත්තම් නැති ඇඳුමක්. ඕනෑ ම ඇඳුමක් අඳින විට යි, ගළවන විට යි, වැඩියෙන් ම වේලාව ගත වන්නේ බොත්තම් දැමීමට යි, ගැළවීමට යි. කඩිනම් රාළ ගේ ඇඳුමේ කමිසය සහ කලිසම වෙන් කරලා නැහැ. දෙක ම එකට එක් කරලා. එය හිසට උඩින් වුන ත් වහන්නට පුළුවනි. ඇඳුමේ කෙළවර ගාන්චුවක් තියෙ-නවා. එය ලිහපු හැටියේ ම මුළු ඇඳුම එකපාරට ම දෙබෑ වෙලා දෙපා ළඟ වැටෙනවා.



තරබාරු බොත්තම් පුංචා ඉතා ම හොඳ ඇඳුම ඇඳ ගත්තා. වැඩියෙන් ම සාක්කු තියෙන ඇඳුම ඉතා හොඳ ඇඳුම හැටියට තම යි, තරබාරු බොත්තම් පුංචා ගණන් ගත්තේ. එයා ගේ හොඳ ම ඇඳුමට සාක්කු දහ හතක් තිබේ. උඩු කබායේ සාක්කු දහයකි: පපුවේ සාක්කු දෙකකි, උදරයට හැඩේට කපාපු සාක්කු දෙකකි. දෙපැත්තට සාක්කු දෙකකි. උඩු කබායේ ඇතුළු පැත්තට සාක්කු තුනකි. පිටේ රහස් සාක්කුවකි. කලිසමේ සාක්කුවල ගණන මෙසේ ය: දෙපැත්තට සාක්කු දෙකකි, දණහිසෙන් පහළ එක් සාක්කුවකි. පසුපසට සාක්කු දෙකකි. ඉස්සරහට සාක්කු දෙකකි. සාමාන්‍යයෙන් ඒ වගේ දණහිසට පහළින් සාක්කු තියෙන ඇඳුම් අඳින්නේ චිත්‍රපට කැමරා ශිල්පීන් විතර යි.

මී පැණියා අල්ලි තියෙන ඇඳුමක් ඇඳ ගත්තා. එයා හැමදා ම කැමති යි අල්ලි තියෙන ඇඳුම් අඳින්නට. එයා ගේ කලිසම ත්, කෝට් එක ත්, කැප් තොප්පිය ත් අල්ලි සහිත යි. කුසුම් පුරයේ කුරු මිට්ටෝ එයාව දැක්කා ම මෙහෙම කියනවා: ''ආන්න බලාපල්ලා ආම් ලැල්ලක් පණ පිටින් ගමන් කරනවා.'' 'අනේඅපොයි' හිම ක්‍රීඩාවට අඳින ඇඳුම ඇඳ ගත්තේ, එය බොහොම ගමන් පහසුව ඇති කරන නිසා. බයනැති ආස ඉරි වැටිච්ච ජර්සියකු යි, ඉරි වැටිච්ච කලිසමකු යි ඇඳ ගත්තා. එයා බෙල්ල වටේට ඔතා ගත්තේ ත් ඉරි වැටිච්ච මප්ලරයක්. බයනැති ආස කුරු මිට්ටෙකුට වඩා ඇඳක ගුදිරියට සමාන යි. ඉතින් ඔය අන්දමට කුරු මිට්ටෝ තමන්ට තියෙන හොඳ ඇඳුම් ඇඳ ගත්තා. හැබැ යි කලබලයාට විතරක් එයා ගේ උඩු කබාය හොයා ගන්නට බැරි වුනේ එයා ඇඳුම් හැම තැන ම වීසිකරන නිස යි. එයා ගේ 'කැප්' තොප්පිය ත් කොපමණ හෙවුවත් හොයා ගන්නට







බැරි වුනා. අන්තිමට ඇඳ යට තිබුණු හිම තොප්පිය විතරක් ඔහු සොයා ගත්තා.

චිත්‍ර අඳින වර්ණ ගුවන් සංචාරය පවතින අවස්වල දී දකින හැම දෙයක් ම ඇඳීමට තීරණය කළා. වර්ණ පින්සල් සහ පාට වර්ග වේලාසනින් ම බැලූම යටින් සවිකර ඇති කූඩයට දැම්මා. සංගීත රාජ් බට නළාවක් අරගත්තා. පුංචි දොස්තර බෙහෙත් මල්ලක් පිළියෙල කරලා කූඩයේ බංකුව යට තැබුවා. බැලූමෙන් ගුවන් ගතවෙලා යන විට කවුරු හරි ලෙඩ වුනොත් ඔහුට බෙහෙත් දීමට පුංචි දොස්තර දුර දක්නා නුවණින් කල්පනා කිරීම හොඳ දෙයක්.

තවම උදේ හයට නැති වුනාට නගරයේ සියලු දෙනා ම වගේ බැලූම වටේට රැස්වෙලා හිටියා. තවත් කුරු මිට්ටන් බොහෝ දෙනෙක් ඒ ගොල්ලන් ගේ ගෙවැටවල ත්, වහල උඩ ත් නැගලා, බැලූම ගුවනේ පාවෙන සැටි බැලීමට සූදානම් වුනා.

කඩිනම් රාළ අන් අයට පෙර බැලූම යට සවිකර තියෙන කූඩයට බැහැලා බංකුවක වාඩි වුනා. එය ඉතාම සැප පහසු තැනකි. ඊළඟට වැඩ බැරි දාස වාඩි වුනා.

''අන්න බලාපල්ලා දැනටමත් කූඩයට රිංගලා බංකුවේ වාඩි වෙලා!'' වටේට හිටිය අය කෑ ගසන්නට වුනා.



''ඔය ගොල්ල වාඩි වුනේ මොකොද? එළියට එන්න! තව වෙලා තියෙනවා!'' එහෙම කියුවේ දක්ස පාල.

''ඒ කොහොම ද? දැන් ඉගිලෙන්නට පුළුවනි!'' වැඩ බැරි දාස කට දැම්මා.

''ඔයා කතා කරන්නේ නො දන්න නිසා. තවම අපි බැලුමට උණුසුම් වාතය පිරෑවුයේ නැහැ.''

''උණුසුම් වාතය පුරවන්නේ මොකට ද?'' කඩිනම් රාළ ඇසුවා.

''උණුසුම් වාතය, සීතල වාතයට වඩා සැහැල්ලු යි. ඒ නිසා උණුසුම් වාතය උඩ යනවා. අපි බැලුමට උණුසුම් වාතය පිරෑවුවා ම බැලුම අප ත් අරගෙන ඉහළට නගීවි,'' දක්සපාල විස්තර කළා.

''එහෙනම් උණුසුම් වාතය පුරවන්න ඕන!'' යැයි කී වැඩ බැරි දාස කඩිනම් රාළ ත් සමග බිමට බැස්සා.

''ආන්න බලාපල්ලා, අර ගොල්ල බිමට බහිනවා. අද ගුවනින් නො යන්නට වගෙ යි,'' වහල උඩ හිටිය කුරු මිට්ටෝ කියුවා.

''සත්තකින් ම නො යන්නට තම යි. මේ වගේ බැලුමකින් ගුවනේ පාවෙන්නට පුළුවන් ද! නිකම් මිනිසුන්ව රවට්ටනවා.'' එහෙම කියුවේ තවත් වහලක හිටිය කුරු පුංචෙක්.

මේ වේලාවේ දී වැලි ගෝනි කීපයක් කූඩයට පටවන්නට කියලා කුරු-මිට්ටන්ට දක්ස පාල නියම කළා. කඩිනම් රාළ යි, 'අනේ-අපොයි' සහ සපුමල් පැංච යි, තවත් කීප දෙනෙකු යි වැලි ගෝනි පුරවලා කූඩයට ගෙනෙන්නට පටන් ගත්තා.

''අර ගොල්ල මොනවා කරනවා ද?'' කිසිවක් තෝරා ගන්නට බැරි මිනිස්සු ඇහුවා. ''අර කූඩයට වැලි ගෝනි පටවන්නේ මන්ද?''

''එයි නුඹලා මොනවා කරනවා ද?'' එහෙම ඇසුවේ වහලයක් උඩට නැගලා බලා ගෙන හිටිය බට්ටා.



''අපි ගුවනට නැගලා, මේ වැලි ගෝනි නුඹලා ගේ ඔළුවට විසි කරනවා'' වැඩ බැරියා පුරසාරම් දොඩවන්නට වුනා.

ඔවු, සත්තකින් ම වැඩ බැරියා දැනගන හිටියේ නැහැ මේ වැලි ගෝනි මොනවට ද කියලා. ඒ නිසා එයාට හිතුණු දේ එයා කිව්වා.

''ඔය ගොල්ලො ඉස්සෙල්ලා අහසට නගින්න!'' බට්ටා කෑ ගැසුවා.

''ඒ ගොල්ල ගුවනින් යාමට බයවෙලා වෙන්නට ඕන. ඒ ගොල්ල වෙනුවට වැලි ගෝනි යවන්නට හදනවා.'' එහෙම කියුවේ ගෙවැටේ නැගලා හිටපු බට්ටිච්චා.

වටපිට හිටපු අය හිනා වෙන්නට පටන් ගත්තා.

''ඔවු, ඔවුන් බයවෙලා! බයවෙන්නට හේතු තියෙනවා ද? කොහොම වුනත් ඔය බැලුම අහසේ පාවෙන්නේ නැහැ.''

''කියන්ට බැහැ. සමහර විට ඒ ගොල්ල ගුවනින් යනවා වෙන්නට ඕන,'' වැටක සිදුරෙන් බැලුම දිහා බලාගෙන හිටපු චූටියා කිව්වා.

බැලුම අවට රැස්වෙලා හිටිය කුරු මිට්ටෝ මේ ගැන වාද-විවාද කරන විට, ගෙවත්ත මැද ගිනි මැලයක් ඇති කරන ලෙස දක්ස පාල අණ කළා. මූරිච්චිය යි, ඉස්කුරුප්පුවා යි ලොකු තඹ හැලියක් ගෙනැවිත් ගිනි මැලයට උඩින් තිබ්බා. වාතය රත් කිරීමට මේ හැලිය හැදුවේ මූරිච්චි සහ ඉස්කුරුප්පු බාස් උන්නැහේලා. හැලියේ කට කුඩා සිදුරක් තියෙන පියනකින් වහලා. හැලියට සුළං පිරිවීමට වෙන ම පොම්පයක් ගෙනැවිත් තිබුණා. හැලියට හුළං පුරවලා, ඒ හුළං රත් වුනා ම, කුඩා සිදුරෙන් එය බැලුම තුළට යනවා.



බැලූම අවට රැස්වෙලා හිටිය අයට මේක තේරුම් ගැනීමට බැහැ. ඉතින් ඒ ගොල්ල නොයෙක් අදහස් කියන්නට පටන් ගත්තා.

''ඒ ගොල්ල අහසේ පාවෙන්නට ඉස්සෙල්ලා සුප් හොද්දක් බීලා උදේ කෑම කන්නට ලෑස්ති වෙනවා.'' එහෙම කියුවේ පුංචි කුසුම්.

''ඉතින් ඔයා හිතන්නේ කොහොම ද? ඔය වගේ ගමනක් යන්නට ඉස්සෙල්ලා ඔයා මොනවා හරි කන්නේ නැති ද?'' බට්ටිච්චා ඇහුවා.

''අපොයි, සත්තකින් ම මොනවා හරි කනවා. සමහර විට එය අවසාන ආහාර වේල වෙන්නට පුළුවනි...'' පුංචි කුසුම් කියුවා.


''අවසාන වරට ද?''

''ඔවු. අවසාන වරට කෑම කාලා, අහසට නගිනවා. බැලූම අහසේ පාවෙලා පුපුරා යාවි. ඒ ගොල්ලා බිම වැටිලා කුඩේ කුඩු වේවි.''

''අපොයි, නැහැ. බැලූම පුපුරන්නේ නැහැ. එහෙම පුපුරන්නට බැලූම අහසට නගින්නට ඕනෑ. නමුත් මේ බැලූම සුමානයක් තිස්සේ ගෙවත්තේ තියෙනවා,'' බට්ටිච්චා කිව්වා.

''දැන් නම් බැලූම ගුවනේ පාවෙනවා ම යි!'' එහෙම කියුවේ පුංචි කුසුම් ළඟ හිටපු රන්මලී.

ආයෙමත් බැලූම අවට රැස්වෙලා හිටපු අය මහ හයියෙන් වාද-විවාද කරන්නට පටන් ගත්තා. එකෙක් කියනවා බැලූම ඉගිලෙ යි කියලා, එවිට අනිකා කියනවා – නැහැ, ඉගිලෙන්නේ නැහැ කියලා. තවත් එකෙක් කියනවා බැලූම ගුවනට නගීවි ය කියලා, එතකොට වෙනත් එකෙක් කියනවා, නැහැ, ගුවනට නගින්නේ නැහැ කියලා. දැන් ඉතින් මේ ගොල්ලන් ගේ කෑ ගැසීම නිසා කිසි



ම දෙයක් ඇහෙන්නේ නැහැ. විවාදය කොතරම් සැර වුනා ද කීවොත්, පුංචි එවුන් දෙදෙනෙක් පොර කා ගන්නට පටන් ගත්තා. ඔවුන් පොර කෑම නැවැත්වුයේ ඔවුන් ගේ ඔළුවලට ඇල් වතුර වත් කළාට පසුව ය.

මේ වන විට හැලියේ ඇති වාතය සෑහෙන තරමට රත් වූ නිසා දක්ස පාල එයින් බැලුම පිරවීමට තීරණය කළා. නමුත් බැලුමට රත් වූ වාතය පිරවීමට ඉස්සෙල්ලා, එහි ඇති සීතල වාතය පිට කරන්නට ඕන. දක්ස පාල බැලුමේ රබර් බටයට බැඳලා තියෙන ලනු පට ලිහලා දැම්මා. එවිට රබර් බටයෙන් පිට වුනේ බැලුම ඇතුලේ තිබුණු සීතල සුළං. බැලුම ගුවනට නගිනවා ද, නැති ද කියලා බලන්නට ආපු කුරු මිට්ටෝ බැලුමේ හුළං ගිහිල්ලා එය කුඩා වන සැටි දැකලා පුදුමයට පත් වුනා. එය හැකිලිලා, රැළි ගැහිලා, කුඩා වෙලා කුඩයට වැටුනා. ඉස්සෙල්ලා විශාල බැලුමක් තිබුණු තැන දැන් තියෙන්නේ කූඩය යි, දැල යි විතර යි.

හුළං පිටවන 'ෂූ' හඬ නැවතුණා. ඔන්න එතකොටැ අවට රැස්වෙලා හිටිය කුරු මිට්ටන් සියලු දෙනා ම බක-බක ගාල හිනා වුනා. බැලුම ගුවනට යන්නේ නැහැ යි කී අය යි, යනවා කී අය යි දෙගොල්ල ම හිනා වුනා. වැඩ බැරි දාස ගේ යාළුවා ගුණේ පැංචා කොයිතරම් ගොඩාක් හිනාවුනා ද යි කියනවා නම් එයා වහලේ උඩ ඉඳලා බිමට පෙරළිලා ඔළුවේ ගල් තැලුමකුත් ඇති කරගත්තා.

''ඔන්න ඒ ගොල්ලො ගුවනින් ගිය හැටි!'' අවට රැස්වෙලා හිටපු අය කියන්නට වුනා. ''දක්ස පාල ගේ බැලුමට ගිය කල දසාව! සුමානයක් තිස්සේ එයා බැලුම හැදුවා. හිටි හැටියේ ම බැලුම පිපිරුණා. හරිම නාටකයක්!මෙතරම් හිනාවෙච්ච දවසක් මතක් කරන්න පවා අමාරු යි!''



ඒ වුනාට දක්ස පාල කුරු මිට්ටන් ගේ කතා ගණන් ගත්තේ නැහැ. එයා බැලුමේ දිග රබර් බටය හැලියේ පියන මැද තියෙන සිදුරට සවි කරලා, පොම්පයෙන් හුළං ගහන්නට නියම කළා. එවිට හැලියට අලුත් වාතය ලැබුනා, හැලියේ තිබ්ච්ච උණුසුම් වාතය බැලුමට ඇතුළු වුනා. බැලුම ටිකෙන් ටික විශාල වෙලා කූඩයෙන් එළියට එන්නට පටන් ගත්තා.

''අන්න බලාපල්ලා! ආයෙමත් බැලුමට හුළං පුරවනවා! හරී ම පුදුම උදවිය!'' වටේට රැස් වෙලා හිටිය අය කියාපි. ''ඔය බැලුම ආයෙමත් පුපුරා වි.''

බැලුම ගුවනේ පාවෙන බව එක් කෙනෙකු වත් විශ්වාස කළේ නැහැ. නමුත් ටිකෙන් ටික බැලුම විශාල වෙලා මහ ලොකු ම ලොකු කොමඩු ගෙඩියක හැඩය ගත්තා. මේ වර බැලුම උඩ ඇදිලා ගිහින් එය වහලා තිබුණු දැලත් ඇදගෙන ඉහළ නගින සැටි වටවෙලා හිටිය අය දුටුවා. අන්න එවිට තම යි සියලු දෙනා ම පුදුමයට පත් වුනේ. දැන් කිසිම කෙනෙක් ලනුව ඉහළට අදින්නේ නැති වුනාට බැලුම ඉබේටම ඉහළ නගින සැටි ඔවුනට පෙනුනා.

''හුරා!'' කියලා පුංචි කුසුමා කෑ ගසා අත්පුඩි ගැහැව්වා.

''ගිරිය පුප්පන්ට එපා!'' බට්ටා අණ කළා.

''බලන්න, බැලුම ඉහළට නගින සැටි!''

''ඒ වුනාට තවම ගුවනට නැංගේ නැහැ. බැලුමට පුළුවන් ද, කුරු මිට්ටන්ව යි, කූඩය යි අරගෙන අහසට නගින්නට!''

බැලුම තවත් විශාල වෙලා ඉහළ නගින සැටිත්, කූඩය පොළවට ඉහළින් ඇදෙන සැටිත් බට්ටාට පෙනුනා. එයා මහ හයියෙන් කෑ ගහන්ට පටන් ගත්තා:




‘‘බැලූම අල්ලා ගනිල්ලා! නැතිනම් බැලූම ගුවනට නගී වි! ඔය ගොල්ලො මොනවා කරනවා ද?’’

බැලූම අහසේ පියාසර නො කළේ එය කජු ගහට බැඳලා තිබුන නිසා. බැලූම පොළවට ඉහළින් ටිකක් නැගලා තියෙනවා විතර යි.

‘‘හුරා!’’ කියලා අවට රැස්වෙලා හිටිය කුරු මිට්ටෝ, කුරු පැංචෝ කෑ ගහන්නට පටන් ගත්තේ හිතේ ආසාව නිසා. ‘‘දක්ස පාල දක්සයා, වැඩට හරීම සූරයා! දක්ස පාල ගේ බැලූමත් දක්ස යි! ඒ ගොල්ලන් බැලූමට පිරෙව්වේ මොනවා ද? වාෂ්ප වෙන්නට ඕන!’’

බැලූම ගුවනේ පියාසර කරන බව දූන් නම් සියලු දෙනාට ම විශ්වාස යි.






**Н. Носов**

ПОДГОТОВКА К ПУТЕШЕСТВИЮ

*На языке сингала*

© සිංහල අනුවාදය සහ චිත්‍ර, රාදුගා
ප්‍රකාශකයෝ, 1986







වැඩ බැරී ආස ගේ හපන්කම් ගැන ඔබ වැඩිදුරටත්
සැලකිලි දක්වති නම්, කුසුම් පුරයේ වැසියන්
ගැන දැන ගැනීමට
ඔබ ආශා කරති නම්, මෙම පොත් පෙළට අයත්
අනික් පොත් කියවන්න:

**ගුවන් ගමනක මුල**

**වලාකුළට උඩින් ගියා**

ISBN 5-05-001067-5
ISBN 5-05-001068-3

150